දරුවන් උදෙසා
බයිබලයක්



# ගිනි මෙන්වූ
# මිනිසා

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ඊශ්‍රායලයට හැම දෙයක්ම අයහපත් ලෙස පැවතුනේය. රජු සහ රැජින දෙවියන් වහන්සේට වෛර කළෝය. මොනතරම් නරක ආදර්ශයක්ද? වැඩි කල් නොගොස් ජනතාව පවා දෙවියන් වහන්සේට වෛර කළ අතර බොරු දෙවිවරුන්ට නමස්කාර කළෝය. කවුරුන් හෝ දෙවියන් වහන්සේට ආදරය කළාද?



එසේය, ඇදහිලිවන්තව නමස්කාර කරන්නන් ස්වල්ප දෙනෙක් සිටියෝය. එක් දිනක් දෙවියන් වහන්සේ ඔවුන් අතරින් කෙනෙකුට කතා කළ සේක. ඔහුගේ නම එළීයා ය.



එළියා දුෂ්ට ආහබ් රජුට,
“ඉශ්‍රායෙල්හි දෙවි
සමිඳාණන් වහන්සේ
ජීවමාන වන බව සැබැවා
සෙ◌්ම, මාගේ වචනයෙන්
මිස මේ අවුරුදුවල
පිනි හෝ වර්ෂාව
නොලැබෙන්නේයැ”යි
කීවේය. එයින් අදහස්
වූයේ සාගතයකි!
දෙවියන් වහන්සේ
තම සෙනඟ වන
ඊශ්‍රායෙල්වරුන්ට
තව දුරටත් ඔවුන්ගේ
දුෂ්ටකම් කිරීමට ඉඩ
නොදුන් සේක.





රජුට අනතුරු ඇඟවීමෙන් පසු, දෙවියන් වහන්සේ එළියාව රටේ නිස්කලංක ස්ථානයකට යැවූ සේක. එහිදී එළියා, ඔයක් අසල නැවතී සිටියේය. ඔහුව පෝෂණය කිරීමට දෙවියන් වහන්සේ කපුටන් යැවූ සේක. කපුටෝ රොටි සහ මස්, උදේ සහ සවස ගෙනාවෝය. එළියා ඔයෙන් වතුර සපයා ගත්තේය.

දේශයට
වර්ෂාව
නොතිබූ
නිසා
ඉක්මනින්
ඔය සිඳී
ගියේය.
දෙවියන්
වහන්සේගේ
වචනය සැබෑ වෙමින් තිබුණි. මුළු රටටම ජලය හිඟ
විය. බෝග වැවුණේ නැත. ජනතාව කුසගින්නේ
සිටියෝය. ඇකැම්විට එළියා, වතුර නොමැති නිසා
ඔහුට කුමක් වේදැයි කල්පනා කරන්නට ඇත.



දෙවියන් වහන්සේ එළියාට කතා කොට, “නැඟිට, ශාරෙපත් වෙත ගොස් එහි වාසය කරන්න. බලන්න, ඔබට ආහාර සපයන ලෙස වැන්දඹුවකට මම අණ කළෙමි”යි කී සේක. දෙවියන් වහන්සේ තම සේවකයාගේ අවශ්‍යතා දැන සිටි සේක. නමුත් ඒවා සපයන්නේ මොනතරම් අමුතු ක්‍රමයකින්ද? නිහතමානීව එළියා දෙවියන් වහන්සේට කීකරු වූයේය. ඔහු ශාරෙපත් වෙත පැමිණි විට, වැන්දඹුව නුවර දොරටු ළඟ ගිනි දැල්වීම සඳහා දර එකතු කරමින් සිටියාය.



“කරුණාකර මට කෝප්පයක
වතුර ටිකක් ගෙනෙන්නයැ”යි
එළියා කාන්තාවට කීවේය.
“කරුණාකර මට රොටි
කැබැල්ලක්ද ගෙනෙන්න.”
ඔහු කීවේය. “මා ළඟ
රොටි නැත,” වැන්දඹුව
පිළිතුරු දුන්නාය. “මා
ළඟ ඇත්තේ
මුට්ටියක පිටි
ස්වල්පයක්
සහ
භාජනයක
තෙල්
ස්වල්පයක්
පමණි.”



කණගාටුදායක
ලෙස කාන්තාව
පැවසුවේ එයද
අවසන් වූ විට, ඇය
සහ ඇගේ පුතා
කුසගින්නෙන් මිය
යන බවය.

“බය නොවන්න. පළමුව මට එයින් කුඩා රොටියක් සාදා ඉන්පසු ඔබටත් ඔබේ පුත්‍රයාටත් සාදාගන්නයැ”යි එළියා කීවේය. “දෙවියන් වහන්සේ පොළොව පිට වර්ෂාව පනවන දවස දක්වා පිටිවත් තෙල්වත් නාස්ති නොවනු ඇත.” එය සිදුවීමට නම් දෙවියන් වහන්සේ හට ආශ්චර්යයක් කිරීමට සිදුවන්නේය. උන්වහන්සේ එය කළ සේක! කාන්තාව සහ ඇයගේ පුත්‍රයා දින ගණනාවක් කෑවත්, පිටි බඳුන ඉවර වූයේවත් තෙල් තුලාව වියළී ගියේවත් නැත.



එළියා ඔවුන් සමඟ ජීවත් වූයේය. දිනක් කණගාටුදායක දෙයක් සිදු විය. වැන්දඹුවගේ පුත්‍රයා මිය ගියේය. එළියා, දරුවාගේ දේහය ඉහළ කාමරයකට රැගෙන ගියේය. ඔහු සමිඳාණන් වහන්සේට මොරගසමින්, “මාගේ දෙවි වූ ස්වාමින් වහන්ස, මේ දරුවාගේ ආත්මය නැවත ඔහු වෙත පැමිණෙව්ව මැනවැ”යි කීවේය. ඒ යාච්ඤා ඉල්ලීම ඉටු කළ නොහැකි දෙයක්ද?



ස්වාමින් වහන්සේ එළියාගේ හඬට සවන් දුන් අතර, දරුවාගේ ආත්මය ඔහු වෙතට හැරී ආවේය. ඔහුට නැවත පණ ලැබිණි. එළියා දරුවා රැගෙන ඔහුගේ මවට දුන් විට ඇය, “ඔබේ මුඛයේ තිබෙන දෙවියන් වහන්සේගේ වචනය සත්‍යය බව මම දැන් මෙයින් දනිමි”යි කීවාය.



අවුරුදු තුනකට පසු, දෙවියන් වහන්සේ එළියාව රජු වෙතට යවා, “මම පොළොවට වැසි වස්වන්නෙමියි කියන්නැ”යි කීසේක.



ආහබ් වෙත යන්න? ඔහුගේ බිරිඳ ජෙසබෙල්, ඒ වන විටත් දෙවියන් වහන්සේගේ අනාගතවක්තෘවරුන් සියයක් ඝාතනය කර තිබුණි. නමුත් එළියා තර්ක නොකළේය. ඔහු ආහබ් රජු වෙතට ගියේය.



ඔවුන් දෙදෙනා
මුණගැසුණු විට, එළියා
ආහබ්ට අභියෝග
කරමින් මුළු ඊශ්‍රායෙල්
ජනතාව සහ බොරු
අනාගතවක්තෘවරුන් 850
දෙනාව රැස් කරන ලෙස
කීවේය. කර්මෙල් කන්ද
නම් ස්ථානයකදී එළියා
සෙනඟට කතා කළේය.
“ස්වාමින් වහන්සේ
දෙවියන් වහන්සේ
නම්, උන්වහන්සේ
අනුව යන්න.”



එළියා හට පූජා කිරීම සඳහා ගොනුන් දෙදෙනෙකු සූදානම් කර තිබිණි. නමුත් ඒවා දැල්වීමට කිසිදු ගින්නක් නොතිබුණි. “ඔබ ඔබේ දෙවිවරුන්ගේ නාමය කියා යාච්ඤා කරන්න, මම සමිඳාණන් වහන්සේගේ නාමයෙන් අයැදින්නෙමි”යි ඔහු කීවේය. “ගින්නෙන් පිළිතුරු දෙන දෙවියන් සැබෑ දෙවියන් වහන්සේය” ජනතාව ඔහු කී දේ පිළිගත්තෝය.



උදේ සිට සවස දක්වා බොරු අනාගතවක්තෘවරු ඔවුන්ගේ බොරු දෙවිවරුන්ට යාච්ඤා කළෝය. ඔවුහු උඩ පනිමින් නැටූ අතර ලේ එනතුරු පිහිවලින් කපා ගත්තෝය. නමුත් ගින්නක් නොපැමිණියේය.





එවිට එළියා දර සහ
පූජාව වතුරෙන්
පොඟවා යාච්ඤා
කළේය. “ස්වාමින්
වහන්ස, ඔබවහන්සේ
දෙවි සමිදාණන්
වහන්සේ බව මේ
සෙනඟ දැනගන්නා
පිණිස මට සවන් දුන
මැනව...” එවිට ස්වාමින්
වහන්සේගෙන් ගිනි
පහළ විය. එය ගවයා
සහ දර ගිනිබත් කළේය.
ඉන්පසු එය ගල්
පූජාසනයද
ගිනිබත් කළේය!

සෙනඟ එය දුටු විට, “සමිදාණන් වහන්සේ දෙවියන් වහන්සේ යැ”යි මොරගැසුවෝය. එවිට එළියා, “බාල්ගේ අනාගතවක්තෘවරුන් අල්ලාගන්න. ඔවුන්ගෙන් එක්කෙනෙක්ටවත් පැන යාමට ඉඩ නොදෙන්නයැ”යි කීවේය. බොහෝ කලකට පෙර ආහබ් රජු කළ යුතුව තිබූ දේ එළියා කළේය. ඔහු බොරු අනාගතවක්තෘවරුන් මරා දැමුවේය.



ඉන්පසු දෙවියන් වහන්සේගේ
සේවකයා ආහබ්ට වර්ෂාව
එන බව කීවේය. වැඩි කල්
නොගොස් කුඩා වලාකුළක් දිස්
විය. වැසි ඇති වේවිද? වසර
තුනකටත් වැඩි මාරාන්තික
නියඟයකින් පසුව?





මද වේලාවකින් අහස
වලාකුළින් අඳුරු වී
සුළඟ සමඟ මහා
වර්ෂාවක් ද ඇති
වූයේය. දෙවියන්
වහන්සේ වර්ෂාව එවූ
සේක. එළියා සත්‍යය
පවසන බව දෙවියන්
වහන්සේ මිනිසුන්ට
පෙන්වූ සේක. දෙවියන්
වහන්සේ සැබෑවූ එකම
දෙවියන් වහන්සේ
පමණක් බව පෙන්වූ
සේක.



ආහබ් රජ දෙවියන්
වහන්සේට සහ ඔහුගේ
සේවක එළියාට ගෞරව කළා
කියා ඔබ සිතනවාද? නැත!
ඇත්ත වශයෙන්ම, ජෙසබෙල්
එළියාව මරා දැමීමට උත්සාහ
කළ නමුත් ඔහු පලා ගියේය.
අවසානයේදී, ආහබ් යුද්ධයේදී
මිය ගිය අතර සේවකයෝ
මාළිගාවේ උස් තාප්පයකින්
ජෙසබෙල්ව බිමට තල්ලු
කළෝය. ඇය පහත ගල් මත
හැපී මිය ගියාය.



එළියා හට කුමක් වුණිද? දිනක්
දෙවියන් වහන්සේ ගිනි අශ්වයන්
සහිත ගිනි රථයක් එවූ සේක.
දෙවියන් වහන්සේගේ ගිනිමය
මිනිසා වූ එළියා සුළි සුළඟකින්
ස්වර්ගයට නැඟ ගියේය.

ගිනි මෙන්වූ මිනිසා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

1 රාජාවලිය 17 - 19,
2 රාජාවලිය 2

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)